## අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - 2016

-----------------------------------------------------------

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පනතේ 12 (4) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කල යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 07

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිතයේ 14 ඡේදය ප්‍රකාරව මණ්ඩලයේ වත්කම් අයිතමය හා ආශ්‍රිත අනාගත ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවය ඇති විට ඒවා වත්කම් ලෙස හඳුනාගත යුතු වුවත්, ආයතනය විසින් දැනට භාවිතා කරමින් පවතින ඉඩම් දෙකක වටිනාකම් තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) ප්‍රමිතයේ 87 ඡේදය ප්‍රකාරව, ආයතනයේ ඉඩම් සම්බන්ධයෙන් පහත සඳහන් හෙළිදරව් කිරීම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

- අයිතිය මත පැනවී ඇති සීමාවන් සහ වගකීම සඳහා ආරක්ෂණයන් ලෙස ප්‍රතිඥා දී ඇති දේපළ, පිරියත හා උපකරණ වල පැවැත්ම හා අගයන්
- දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම සඳහා වූ ගිවිසුම් ගත බැඳීම් ප්‍රමාණය

(ඇ) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.39,282,116 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් සඳහා ප්‍රමාණාත්මකව වෙන්කිරීම් කර නොතිබීම නිසා උපචිත වියදම් රු. 402,815කින් ඉක්මවා 2017 වර්ෂයේදී ගෙවීම් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී විදේශ සංචාරයක් වෙනුවෙන් වියදම් දැරීම සඳහා බැංකුව වෙත රු.1,045,992 ක ස්ථාවර නියෝගයක් ලබා දී තිබියදී එම මුදල උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රමාණය ලෙජරය අනුව රු.22,616,678 ක් වුවද ආදායම් ප්‍රකාශනය හා ස්ථාවර වත්කම්වලට අදාල උපලේඛනය අනුව රු.22,639,478 ක් වශයෙන් අගයන් දෙකක් දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල තුල්‍යතාවය පිළිබඳ ගැටළුකාරි විය.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය අවසානයට ගිණුම්වල දක්වා ඇති වත්කම්වල වටිනාකම් සහ ඉදිරිපත් කරන ලද විස්තරාත්මක උපලේඛනවල වටිනාකම් අතර වත්කම් කාණ්ඩ හතරක රු. 497,071 ක් වැඩියෙන් හා වත්කම් කාණ්ඩ තුනක රු. 510,533 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2016 වර්ෂයේ අවසාන ගිණුමේ දක්වා ඇති ක්ෂය වටිනාකම හා ආයතනය විසින් ක්ෂය ගණනය කිරීමේ උපලේඛනය අනුව දක්වා ඇති ක්ෂය වටිනාකම් අතර රු. 6,685,931 ක ශුද්ධ වෙනසක් පැවතුණි.

(ඇ) වත්කම් කාණ්ඩ පහක වත්කම් ලේඛනය සහ ලෙජරය අතර වටිනාකමේ රු. 1,928,853ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) ශේෂ පත්‍රයේ ලැබියයුතු ආපදා ණය හා විශේෂ අත්තිකාරම් ලෙස රු.9,870,610 ක් දක්වා තිබූ නමුත් එහි උපලේඛනය (සටහන් අංක 17) අනුව එම ශේෂ එකතුව රු.9,858,175 ක් වූයෙන් රු.12,435 ක වෙනසක් පැවතුණි.

**2.2.4 අවිනිශ්චිත ගිණුම්**

ඉකුත් වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.480,900 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත දැක්වෙන ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ විගණන සාක්ෂි |
|---|---|---|
| (අ) ඉඩම් | 11,067,487 | ඔප්පු සහ බදු ගිවිසුම් |
| (ආ) රසායන ද්‍රව්‍ය තොගය | 2,535,326 | තොග සත්‍යාපන වාර්තා |

**2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 10 කට වැඩි කාලයක් අය කර ගැනීමෙන් තොරව පැවති අත්තිකාරම් ශේෂ රු.1,782,060 ක් වූ අතර එම ශේෂයන් කුමන වර්ෂයේ සිට පැවතෙන්නේද යන්න නිශ්චිතව හඳුනාගත නොහැකි විය.

(ආ) බාහිර ආයතන 11 ක තැන්පත් කර තිබූ එකතුව රු.184,313 ක තැන්පතුවලට අදාල ලදුපත් මණ්ඩලය සතු නොවූ බැවින් එම තැන්පතු මුදල් අයකර ගැනීම පිළිබඳ අවදානමක් පැවතුනි.

**2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

---

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2007 අංක 54 දරන ඖෂධ වලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) කිරීම පිළිබඳ පනතේ 4(3) වගන්තිය | පුද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන විසින් සිදුකරනු ලබන ප්‍රතිකාර පිළිබඳ සාර්ථකභාවය සම්බන්ධයෙන් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන අධ්‍යක්ෂක විසින් ඉදිරිපත් කළ යුතු කාලීන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104(3) | වාහන අනතුරු සම්බන්ධයෙන් වූ වාර්තා විගණකාධිපති වෙත එවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 109 (1)(ආ) | වාහන අනතුරු සම්බන්ධයෙන් වූ පාඩු විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 569 III වැනි පංතිය | විවිධාකාර ස්වරූපයේ තැන්පතු "විවිධ තැන්පතු" නමින් පොදු ගිණුමක සටහන් කල යුතු වුවත් මණ්ඩලය විසින් රු. 506,813ක් වූ තැන්පතු වෙනුවෙන් එවැනි ගිණුමක් නඩත්තු කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 751 | ලැබෙන සියළුම භාණ්ඩ වහාම භාණ්ඩ ලේඛන පොතෙහි ඇතුළත් කළ යුතු වුවත් මණ්ඩලය විසින් 2016 දෙසැම්බර් 31 දිනට මිලදී ගෙන තිබුණු රු.888,995 ක් වටිනා භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ලේඛන වල ඇතුළත් කර නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 754 | සෑම මුදල් වර්ෂයක් අවසානයේදී බඩු ලේඛන පොත් තුලනය කළයුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 09 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු. මිලියන 74 ක්වූ වත්කම් සඳහා ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.37,183,014 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.14,110,836 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.23,072,178 කින් වර්ධනය වී තිබුණි. මෙහෙයුම් වියදම් රු.69,217,174 කින් වැඩි වී තිබීම ඌනතාවයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී අඛණ්ඩ මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබූ අතර 2012 වර්ෂයේදී රු. 15,013,481 ක් වූ එය සමාලෝචිත වර්ෂය අවසානයට රු.37,183,014 ක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු. 36,922,418 ක් වූ මණ්ඩලයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු. 81,587,124 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

---------------

1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පනතේ අරමුණු පහත දැක්වේ.

* අන්තරායකර ඖෂධ නිවාරණ හා පාලනය කිරීම සම්බන්ධව ජාතික ප්‍රතිපත්තියක් සැකසීම හා සමාලෝචනය කිරීම සහ එවැනි ප්‍රතිපත්ති පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සැකසීම හා සමාලෝචනය කිරීම එවැනි ප්‍රතිපත්ති පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

* මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය හා විදේශීය මූලාශ්‍ර වලින් පරිත්‍යාග හා ආධාර භාර ගැනීම.

* අන්තරායකර ඖෂධ නිවාරණ හා පාලනයේ නිරතව සිටින නියෝජිතායතනවල කටයුතු සම්බන්ධීකරණය.

* මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූ පුද්ගලයන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු වැඩි දියුණු කිරීම සහ ළමුන් හා වැඩිහිටි පුද්ගලයන් සඳහා ජාතික මත්ද්‍රව්‍ය භාවිතය හා නිවාරණය පිළිබඳ අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම.

* අන්තරායකර ඖෂධ භාවිතය ව්‍යාප්තිය, ඒ සඳහා හේතු හා අන්තරායකර ඖෂධ භාවිතයෙන් ඇති වන නෛතික, වෛද්‍ය, සාමාජීය, සංස්කෘතික හා ආර්ථික ගැටළු පිළිබඳ පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම හා ඒ සම්බන්ධ කටයුතු ඉටු කිරීමට භාර ගැනීම, ඖෂධ පාලන කටයුතු වල නියැලී සිටින ජාතික කලාපීය හා අන්තර් ජාතික සංවිධාන හා නියෝජිතායතන සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීම.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් ජාතික මාදක රසායනාගාරයේ 2016 දෙසැම්බර් 31 දිනට කාර්යසාධනය පහත දැක්වේ.

2016 දෙසැම්බර් 31 දිනට

| අංකය | | අපේක්ෂිත ඉලක්කය | ලබා කරගත් සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 1. | වීථි හෙරොයින් වල මිල සහ පාරිශුද්ධතාවය අතර සම්බන්ධතාවය හඳුනාගැනීමට අදාළ විශ්ලේෂණ සහ වීථි හෙරොයින් වල නව තනුකකාරක අඩංගු බවට සිදුකරන ලද විශ්ලේෂණය | 360 | 133 | 36.9 |
| 2. (i) | අතිරේක ආහාරමය නිෂ්පාදන සාම්පල විශ්ලේෂණය | - | 06 | - |
| (ii) | ක්‍රීඩාවේදී භාවිතා කරන ක්‍රියාකාරීත්ව වර්ධක ඖෂධවල පරිවෘත්තිය ද්‍රව්‍ය අඩංගු බවට සිදුකරන ලද ජීව විද්‍යාත්මක සාම්පල විශ්ලේෂණය. | - | 01 | - |
| 3. | ඇල්කොහොල් සාම්පල විශ්ලේෂණය | - | 67 | - |
| 4. | මාදක සහ මනෝවර්ථකවල පරිවෘත්තිය ද්‍රව්‍ය අඩංගු බවට ජීව විද්‍යාත්මක සාම්පල සඳහා කරනු ලබන විශ්ලේෂණ | | | |
| | සාම්පල ගණන | 180 | 63 | 35.0 |
| | පරීක්ෂණ ගණන | - | 121 | |
| 5. | එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ වැලැක්වීමේ කාර්යාලය මගින් ලබාදී තිබෙන ඊ - අධ්‍යාපන වැඩසටහන් ගණන | 48 | 20 | |
| | සහභාගී වූ සංඛ්‍යාව | - | 123 | 41.7 |
| 6. (i) | මාදක ඖෂධ සහ මනෝවර්ථක ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල සකස් කර දීම | 60 | 07 | 11.7 |
| (ii) | අධිකරණ කටයුතු සඳහා අවශ්‍ය විද්‍යාත්මක සේවාවන් ලබා දීම | - | 01 | - |
| (iii) | ශ්‍රී ලංකා රේගුව සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දිම | - | - | - |
| 7. | පර්යේෂණ ප්‍රකාශන | - | 01 | - |
| 8. | රසායනාගාරය මගින් සිදුකරනු ලබන පරීක්ෂණ ප්‍රමිතිකරණයට අනුව පවත්වා ගෙන යාම | /z/≤2 | 2016 පළමු වටයේ ප්‍රතිඵල ලැබීමට නියමිතයි | 100 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යසාධන ක්ෂේත්‍රයන් 8 අතුරින් අතිරේක ආහාරමය නිෂ්පාදන සාම්පල විශ්ලේෂණය, ක්‍රීඩාවේදී භාවිතා කරන ක්‍රියාකාරිත්ව වර්ධක ඖෂධවල පරිවෘත්තිය ද්‍රව්‍ය අඩංගු බවට සිදුකරන ලද ජීව විද්‍යාත්මක සාම්පල විශ්ලේෂණය, ඇල්කොහොල සාම්පල විශ්ලේෂණය, මාදක ඖෂධ සහ මනෝවර්ථක ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල සකස් කර ලබාදීම, අධිකරණ කටයුතු සඳහා අවශ්‍ය විද්‍යාත්මක සේවාවන් ලබා දීම, ශ්‍රී ලංකා රේගුව සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දීම හා පර්යේෂණ ප්‍රකාශන යන ක්ෂේත්‍රවල ඉලක්ක ගත සාම්පල සංඛ්‍යාව සඳහන් කර නොතිබීම නිසා කාර්යසාධනයේ ප්‍රගතිය විගණනයට තහවුරු කර ගත නොහැකි විය. තවද ක්ෂේත්‍ර 4 ක කාර්යසාධනය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුනි.

(ආ) රසායනාගාරය මගින් සිදුකරනු ලබන පරීක්ෂණ ප්‍රමිතිකරණයට අනුව පවත්වාගෙන යාමේ නිරවද්‍යතාවය පෙන්වන පරීක්ෂණයේ ප්‍රතිඵල ලැබීමට නියමිතව පවතින බව දක්වා තිබුණද එහි කාර්යසාධනය සියයට 100ක් ලෙස දක්වා තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------------

තත්කාර්ය අතුරු අග්‍රිම එය දෙන ලද කාර්යය නිම වූ විගස පියවිය යුතු වුවත් අත්තිකාරම් පියවීම සඳහා දින 14 සිට දින 141 දක්වා කාලයක් ගත කර තිබූ අතර රු.78,850 ක අත්තිකාරම් 2017 මාර්තු 15 දින වන විටත් පියවා නොතිබුණි. තවද දෙනලද අත්තිකාරම් මුදලින් සියයට 50 කට වඩා අඩුවෙන් වියදම් කර තිබූ අවස්ථා පැවතුනු අතර වටිනාකම රු.107,595 ක් වූ අත්තිකාරම් අදාල කාර්යය සඳහා වියදම් නොකර දින 02 ත් දින 141 ත් අතර කාලයක් අත රඳවාගෙන ආපසු පියවා තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයට ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2016 පෙබරවාරි මාසයේ සැලසුම් කර තිබුණ ද රු.2,068,605 ක ලිපි ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණේ 2016 නොවැම්බර් මාසයේදී වූ හෙයින් අවශ්‍යතාවයක් නොතිබියදී ලිපි ද්‍රව්‍ය ඇස්තමේන්තු කර තිබුණි.

(ආ) ජාතික මාදක රසායනාගාරයේ තොගය රජයේ රස පරීක්ෂක විසින් ගණනය කිරීමේදී තොග වාර්තාවේ රසායනික ද්‍රව්‍ය 13 ක  වටිනාකම් රු. 89,343 කින් අධිගණනය වී තිබූ අතර රසායනික ද්‍රව්‍ය 9 ක වටිනාකම් රු.45,888 කින් ඌන ගණනය වී තිබුණි.

(ඇ) 2016 වර්ෂයේදී අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් විදේශ ගමන් වියදම් සඳහා රු.4,823,223 ක් වැය කර තිබූ අතර, එම මුදලින් රු.3,067,602 ක් එනම් සියයට 64 ක් මණ්ඩලයේ සභාපති සඳහා පමණක් වැය කර තිබුණි. මෙම මුළු වියදම 2015 වර්ෂය හා සාපේක්ෂව සියයට 77 ක වැඩිවීමකි.

(ඈ) ඉහත වියදමට අමතරව මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ UNDCP 1995 ව්‍යාපෘතියේ අරමුණු විගණනයට පැහැදිළි නොකර එම ව්‍යාපෘති මුදලින් රු.1,957,830 ක් අධ්‍යක්ෂ ජනරාල්ගේ විදේශ ගමන් සඳහා වැය කර තිබුණි.

**4.4 අරමුදල් ඌන උපයෝජනය**

සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ බැංකු ජංගම ගිණුම් 06 කට අදාල එකතුව රු.9,330,322 ක ශේෂ මාස 05 සිට මාස 12 දක්වා උපයෝජනය කිරීමකින් තොරව නිෂ්කාර්යව බැංකු ගිණුම්වල රඳවා තිබුණි.

**4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

2014 අප්‍රේල් 30 දින රු.2,971,405 ක් වැයකර හෝමාගම ප්‍රදේශයේ පර්චස් 40 ක ඉඩමක් මිලදීගෙන තිබුණ ද එය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඵලදායී කාර්යයක් සඳහා යොදා ගෙන නොතිබුණි.

**4.6 ආර්ථික නොවූ ගනුදෙනු**

ආසියා හා පැසිෆික් කලාපීය නීතිය බලාත්මක කිරීමේ ජාතික ආයතනයන්ගේ සමුළුව (HONLEA) 2016 ජුනි 20 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර ශාලාවේදී පැවැත්වීම සඳහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලය වෙත ලබාදී තිබූ රු.12,720,000 ක මුදලින් රු.1,068,726 ක් නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යවරයා ඇමෙරිකා එක්සත් ජනපදයේ පැවති එක්සත් ජාතීන්ගේ විශේෂ මහා සභා රැස්වීමට සහභාගි වීම වෙනුවෙන් වැය කර තිබුණි.

**4.7 වෙනත් ආයතනවල සම්පත් උපයෝජනය කිරීම**

සෞඛ්‍ය අමාත්‍යාංශයට නීත්‍යානුකූල අයිතිය පවතින ඉඩමක හා ගොඩනැගිල්ලක මණ්ඩලයේ තලංගම ප්‍රතිකාර නිවාරණ මධ්‍යස්ථානය පවත්වා ගෙන යන අතර ඒ සඳහා වූ ගිවිසුම 1993 ජුනි 01 දිනෙන් අවසන් වී තිබුණ ද එය 2017 මාර්තු 15 දින දක්වා අළුත්කර නොතිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

ආයතනය ආරම්භයේ සිටම අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවති අතර එම පුරප්පාඩුව පිරවීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) සහ (ඉ) වගන්ති ප්‍රකාරව අවම වශයෙන් වසර තුනක (03) කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තු ගත කර තිබිය යුතු වුවත් මණ්ඩලය විසින් පිළියෙල කරන ලද සැලැස්ම වසරකට සීමා කර තිබුණු අතර එය යාවත්කාලීන කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| | ---------------------------- | ------------ |
| (අ) | ගිණුම්කරණය | (i) මූල්‍ය ප්‍රකාශන හා ගිණුම් පොත්පත් නිවැරදිව පිළියෙල නොකිරීම.<br>(ii) ජ'නල් සටහන් සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබීම. |
| (ආ) | වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව නඩත්තු නොකිරීම. |
| (ඇ) | මුදල් කළමනාකරණය | (i) අක්‍රීය බැංකු ගිණුම් පැවතීම.<br>(ii) භාණ්ඩ ලැබීමට පෙර මුදල් ගෙවීම. |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම. |
| (ඉ) | වියදම් පාලනය | සැලසුම් නොකල කාර්යයන් ඉටුකිරීම |